## විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් රාජ්‍ය නිලධාරීන්ගේ දෙවන ජාතික භාෂා ප්‍රවීණතාවය සඳහා ක්‍රියාත්මක කෙරෙන වැඩසටහන

මහින්ද චින්තනයට අනුව ජනාධිපතිතුමා විසින් අරඹා ඇති ත්‍රෛභාෂික ශ්‍රී ලංකාවක් බිහි කිරීමේ ජාතික කර්තව්‍යයට පූර්ණ සහයෝගය දැක්වීම සඳහා සමාජ මෙහෙවරක් ලෙස සලකා රාජ්‍ය නිලධාරීන් ඇතුළු පොදු මහජනතාව වෙනුවෙන් දෙවන ජාතික භාෂා ප්‍රවීණතාවය සඳහා සහතික පත්‍ර පාඨමාලා හතරක් පැවැත්වීමට ත්‍රෛභාෂික ශ්‍රී ලංකාවක් සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකාය සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පියවර ගෙන තිබේ. මෙම පාඨමාලා හතර අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද නිලධාරි කමිටුව විසින් හඳුන්වා දී ඇති විෂය මාලා හතරට ගැලපෙන පරිදි පිළියෙල කොට ඇත.

පාඨමාලා සඳහා පිළියෙල වන උපකරණ සහ ඉගැන්වීම් ක්‍රම ජාත්‍යන්තර මට්ටමේ ක්‍රමවේදයන් හා සමාන වේ. මෙම පාඨමාලාවට විද්‍යුත් අධ්‍යාපන ක්‍රම ඇතුලත් කර ඇති බැවින් රාජ්‍ය නිලධාරීන්ට සහ පොදු මහජනයාට මෙම පාඨමාලා තම නිවසේදී හෝ තම කාර්යාලයේදී හැදෑරීමට අවස්ථාව උදා වෙයි. මෙම පාඨමාලා සඳහා නවීන ඉගැන්වීම් හා අධ්‍යාපන ක්‍රම ඇතුලත් කර ඇති බැවින් ශ්‍රී ලංකාවට ආඩම්බර විය හැකි සේවයක් ලැබෙන බව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහතික කරයි. විශ්ව විද්‍යාලවල මහාචාර්යවරුන් සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන්ගේ සහභාගිත්වයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් මේ සඳහා විෂය මාලාව පිළියෙල කොට තිබේ.

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් මෙම පාඨමාලා හතර ස්ථාපිත කිරීම සඳහා මොඩියුල හා ක්‍රියාකාරකම් සහිත අත්පත්‍රිකා සකස් කිරීමට විවිධ භාෂා පිළිබඳ ප්‍රවීණතාවයෙන් යුත් විශ්ව විද්‍යාලවල මහාචාර්යවරුන් සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන්ගෙන් සැදුම්ලත් කමිටු දෙකක් පත්කොට ඇත.

මෙම කාර්යය සඳහා විශාල උන්නඳුවක් දක්වා එම කටයුත්ත ආරම්භ කළ ජනාධිපති උපදේශක ත්‍රෛභාෂික ශ්‍රී ලංකාවක් සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකායේ සභාපති සුනිමල් ප්‍රනාන්දු මහතා සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිනි මහාචාර්ය ක්ෂණිකා හිරිඹුරේගම මහත්මියට සහ එම කටයුත්තට සහයෝගය ලබා දුන් විශ්ව

විද්‍යාල විද්වතුන්ට ගෞරවය හිමි කරමු. විශේෂයෙන්ම මෙය ජාතික කර්තව්‍යයක් ලෙස සලකා එයට උරදුන් සබරගමුව විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා සහ භාෂා අංශයේ හිටපු පීඨාධිපති මහාචාර්ය එම් සුනිල් ශාන්ත මහතාට විශේෂ ගෞරවයක් හිමි කිරීමට කැමැත්තෙමු.

# දෙවන ජාතික භාෂා ප්‍රවීණතාවය සඳහා පාඨමාලා

ශ්‍රී ලංකාවේ කණිෂ්ඨ, ද්විතීයක සහ විධායක මට්ටම් වලට අයත් රාජ්‍ය සහ පෞද්ගලික අංශයන්හි සේවය කරන සිංහල සහ දෙමළ නිලධාරීන් උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ නිර්දේශයන්ට සහ ශ්‍රී ලාංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ත්‍රෛභාෂික ප්‍රතිපත්තියට අනුව තම දෙවන ජාතික භාෂාවේ ප්‍රවීණත්වය ලබා ගත යුතුව ඇත. ජාතීන් අතර අන්‍යොන්‍ය සහයෝගයෙන් සහ සහජීවනයෙන් ජීවත් වන ආසියාවේ දියුනු වන ජාතියක් ලෙස ශ්‍රී ලාංකිකයන් ජාත්‍යන්තරය විසින් පිළිගෙන ඇත. කලින් සඳහන් කළ පරිදි රාජ්‍ය සහ පෞද්ගලික අංශවල කාර්යක්ෂමතාවය වර්ධනය සඳහා දෙවන ජාතික භාෂාව පාවිච්චි කිරීම සංස්කෘතික, සමාජයීය හා ආර්ථික වශයෙන් නීතිගත වී ඇත. ත්‍රෛභාෂික ප්‍රතිපත්තිය ක්‍රියාවට නගමින් රටේ ජාතික සමගිය, ඒකාග්‍රතාවය සහ සමානාත්මකභාවය ගොඩ නැගීමේ පරමාර්ථය ඇතිව මෙම පාඨමාලා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට සැලසුම් කොට ඇත. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සමාජ විද්‍යා, මානව ශාස්ත්‍ර සහ අධ්‍යාපන ස්ථාවර කමිටුව (Standing Committee on Social Sciences, Humanities and Education) සහ ත්‍රෛභාෂික ශ්‍රී ලංකාවක් සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකාය රටේ මෙම අවශ්‍යතාවය හඳුනාගෙන විශ්වවිද්‍යාල වල මෙම අංශයන්හි විද්වතුන් සම්බන්ධකරගෙන රාජ්‍ය නිලධාරීන් සහ පොදු ජනතාව සඳහා භාෂා ප්‍රවීණතාවය සඳහා මට්ටම් හතරක පාඨමාලා සැලසුම් කිරීමට තීරණය කොට තිබේ. දෙවන ජාතික භාෂා ප්‍රවීණතාවය සඳහා පාඨමාලා හදාරන්නන් විසින් පහත සඳහන් භාෂා කුසලතා වර්ධනය කරමින් ප්‍රායෝගික ලෙස දෙවන ජාතික භාෂාව පාවිච්චි කළ හැකි වන පරිදි මෙම පාඨමාලා සකසා ඇත.

1. සවන් දීමේ හැකියාව
2. කථන හැකියාව
3. කියවා අවබොධ කර ගැනීමේ හැකියාව
4. ලිවීමේ හැකියාව

**පාඨමාලා හතර**

1. සිංහල/දෙමළ දෙවන ජාතික භාෂා ප්‍රවීණතාවය සඳහා සහතික පත්‍ර පාඨමාලාව
2. සිංහල/දෙමළ දෙවන ජාතික භාෂා ප්‍රවීණතාවය සඳහා මධ්‍යම (Intermediate) සහතික පත්‍ර පාඨමාලාව
3. සිංහල/දෙමළ දෙවන ජාතික භාෂා ප්‍රවීණතාවය සඳහා උසස් සහතික පත්‍ර පාඨමාලාව
4. සිංහල/දෙමළ දෙවන ජාතික භාෂා ප්‍රවීණතාවය සඳහා ඩිප්ලෝමා පාඨමාලාව

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සමාජ විද්‍යා, මානව ශාස්ත්‍ර හා අධ්‍යාපන ස්ථාවර කමිටුව (Standing Committee on Social Sciences, Humanities and Education) මගින් පහත සඳහන් විශ්ව විද්‍යාලයන්හි මෙම පාඨමාලා ආරම්භ කිරීමට යෝජනා කර ඇත.

1. කොළඹ විශ්වවිද්‍යාලය
2. කැළනිය විශ්වවිද්‍යාලය
3. ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
4. රුහුණු විශ්වවිද්‍යාලය
5. යාපනය විශ්වවිද්‍යාලය
6. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
7. ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය
8. නැගෙනහිර විශ්වවිද්‍යාලය